සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 10 ශ්‍රේණිය

## කෘෂි හා ආහාර තාක්ෂණය - I

**නම/විභාග අංකය :-- ........................................................................... කාලය : පැය 01 යි.**

i සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
ii අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
iii ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (x) ලකුණ යොදන්න
iv එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

---

1. ශ්‍රී ලංකාවේ සංවර්ධනය කෙරෙහි කෘෂිකර්මාන්තයෙන් සිදුවන දායකත්වයට හේතු වන්නේ,
   1. ශ්‍රී ලාංකිකයින්ගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම. 2. කාර්මික අංශයට අමුද්‍රව්‍ය සැපයීම
   3. කෘෂි නිෂ්පාදන අපනයනයට යොමු කිරීම. 4. ඉහත සියල්ල මගින්.

2. ශ්‍රී ලංකාවේ වාරි තාක්ෂණය සඳහා ප්‍රථම වරට වැවක් තැන වූ රජතුමා වනුයේ,
   1. දේවානම්පියතිස්ස රජතුමා ය. 2. පණ්ඩුකාභය රජතුමා ය. 3. වසභ රජතුමා ය. 4. පරාක්‍රමබාහු රජතුමා ය.

3. වැවක රළපනාව මගින් සිදුකරන කාර්යය වනුයේ,
   1. වැවේ අතිරික්ත ජලය පිට කිරීමයි.
   2. වැවක ජලය බෙදා හැරීමේ දී ඇතිවන පීඩනය පාලනය කිරීමයි.
   3. වැව් බැම්ම සේදී නොගොස් ආරක්ෂා කර ගැනීමයි.
   4. වැවේ ජලය එක්රැස් කර තබා ගැනීමයි.

4. ශ්‍රී ලංකාවේ වාරි පද්ධතියේ අති විශාල සංවර්ධනයක් ඇති කළ ඓතිහාසික යුගය ලෙස සලකනුයේ,
   1. අනුරාධපුර යුගයයි. 2. යාපහුව යුගයයි. 3. මහනුවර යුගයයි. 4. දඹදෙණි යුගයයි.

5. ''තලවකැලේ'' නුවරඑළිය දිස්ත්‍රික්කයට අයත් නගරයකි. එහි ඇති කෘෂිකාර්මික වැදගත්කම වන්නේ,
   1. මධ්‍යම වී පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටා තිබීම.
   2. ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය පිහිටා තිබීම.
   3. ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය පිහිටා තිබීම.
   4. බීජ අර්තාපල් පර්යේෂණායතනය පිහිටා තිබීම.

6. නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාවේ ආරම්භ කරන ලද ප්‍රථම බහුකාර්ය යෝජනා ක්‍රමය වූයේ ගල්ඔය නිම්න සංවර්ධන යෝජනා ක්‍රමයයි. මේ යටතේ ඉදිකළ ජලාශය කුමක් ද?
   1. රන්දෙණිගල ජලාශයයි. 2. උඩවලව ජලාශයයි. 3. කිරිදි ඔය ජලාශයයි. 4. සේනානායක සමුද්‍රයයි.

7. ශ්‍රී ලංකාවට නිරිත දිග මෝසම් වර්ෂාව ලැබෙන්නේ,
   1. දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා මාසවල ය.
   2. මැයි සිට සැප්තැම්බර් දක්වා මාසවල ය.
   3. ජනවාරි සිට අප්‍රේල් දක්වා මාසවල ය.
   4. නොවැම්බර් සිට දෙසැම්බර් දක්වා මාසවල ය.

8. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප බෙදීම සඳහා ප්‍රධාන වශයෙන් පදනම් කරගෙන ඇත්තේ,
   1. උච්චත්වයයි. 2. උෂ්ණත්වයයි. 3. සාපේක්ෂ ආර්ද්‍රතාවයයි. 4. වර්ෂාපතනයයි.

9. පහත දැක්වෙන ප්‍රකාශ සලකා බලන්න.
A වියලි කලාපයේ කෘෂිකාර්මික කටයුතුවලදී යල කන්නයේ ජල ඌණතාවයකට මුහුණ පෑමට සිදු වේ.
B අධික වර්ෂාව නිසා බෝග හානි සිදු වේ.
C සාර්ථක බෝග වගාවකට වැදගත් වනුයේ ලැබෙන වර්ෂාපතන ප්‍රමාණයට වඩා එහි ව්‍යාප්තියයි.
මෙම ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,
1 A හා B පමණි 2. B හා C පමණි 3. A හා C පමණි 4. A, B,C සියල්ලම

10. සමහර ශාකවල පුෂ්පීකරණය සඳහා දිවා කාලයේ දිග බලපායි. දිවා කාලයේ දිගට ශාක දක්වන ප්‍රතිචාරය හඳුන්වන්නේ,
1. ප්‍රභා අවධි සංවේදීතාවය වශයෙනි. 2. ප්‍රභාසංස්ලේෂණය වශයෙනි.
3. රසොද්ගමනය වශයෙනි. 4. උත්ස්වේදනය වශයෙනි.

11. උච්චත්වය මුහුදු මට්ටමේ සිට ඉහළ යන සෑම 100m ක දීම වායුගෝලීය උෂ්ණත්වය අඩුවීම ආසන්න ලෙස
1. සෙන්ටිග්‍රේට් අංශක 10 කිනි. 2. සෙන්ටිග්‍රේට් අංශක 0.64 කිනි
3. සෙන්ටිග්‍රේට් අංශක 0.44 කිනි 4. සෙන්ටිග්‍රේට් අංශක 2.5 කිනි

12. කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයක දෛනිකව ලබා ගැනෙන කාලගුණ දත්තයන් නොවන්නේ,
1. වර්ෂාපතනය යි. 2. උෂ්ණත්වය යි. 3. සුළගේ වේගය යි. 4. උත්ස්වේදනය යි.

13. කාලගුණික පාරමිතික පිළිබඳව ප්‍රකාශ පහත දැක්වේ.
A සුළගේ වේගය පැයට කිලෝමීටර් වලින් මනිනු ලැබේ. B ආලෝක තීව්‍රතාවය ලක්ස්වලින් මනිනු ලැබේ
C වර්ෂාපතනය මිලිලීටර් වලින් මනිනු ලැබේ.
මින් නිවැරදි ප්‍රකාශය වන්නේ,
1 A හා B පමණි 2. B හා C පමණි 3. A හා C පමණි 4. A, B,C සියල්ලම

14. වියලි පස් කුට්ටියක් අඩි 5 ක පමණ උසක සිට පොළොව මතට වැටීමට සලස්වා නිරීක්ෂණය කරන පාංශු භෞතික ලක්ෂණය කුමක් ද?
1. පාංශු වයනයයි. 2. පාංශු ජලයයි. 3. පාංශු වාතයයි. 4. පාංශු ව්‍යුහයයි.

15. අධික ලෙස තද වූ පසක පාංශු වාතය දියුණු කිරීමට නම්,
1. පසට ජලය යෙදිය යුතු ය. 2. පස බුරුල් කළ යුතු ය.
3. පසට රසායනික පොහොර එකතු කළ යුතු ය. 4. පස ජීවාණුහරණය කළ යුතු ය.

16. කෘෂිකාර්මික කටයුතුවල දී පාංශු වයනය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A වැලි අධික පසක ජලය රැඳීම අඩු බැවින් අල බෝග වගා කිරීමට සුදුසු ය.
B මැටි අධික පසක ජල වහනය දුර්වල බැවින් උස් පාත්ති සැකසීම සුදුසු වේ.
C වැලි අධික පසට කොම්පෝස්ට් ද, මැටි අධික පසට වැලිද එකතු කිරීමෙන් වයනය දියුණු කළ හැකි ය.
මින් නිවැරදි පිළිතුර වන්නේ,
1 A හා B පමණි 2. B හා C පමණි 3. A හා C පමණි 4. A, B, හා C සියල්ලම.

17. හුණුගල් යනු,
1. ආග්නේය පාෂාණයකි. 2. මැග්මා වර්ගයකි 3. විපරිත පාෂාණයකි. 4. අවසාදිත පාෂාණයකි.

18. පාංශු පැතිකඩ මතුපිටින් පිහිටි ස්ථරය වන්නේ,
1. විශෝධන කලාපයයි. 2. සංචායක කලාපයයි. 3. මූලික ද්‍රව්‍යයයි. 4. මාතෘ පාෂාණයයි.

19. පාංශු ජල සංරක්ෂණ ක්‍රමයක් නොවන්නේ,
1. පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීම. 2. පස වසුන් කිරීම
3. උත්ස්වේදනය අඩු කිරීමට වල් පැලෑටි ඉවත් කිරීම 4. පැල මුල කලගෙඩි වැලලීම මගින් ජලය සැපයීම.

20. සිසුන් පිරිසක් සරල වර්ෂාමානයක් භාවිත කරමින් ජනවාරි 01 දින සිට දෛනික වර්ෂාපතනය මැන, වර්ෂය අවසානයේ එම පාඨාංක එකතුවෙන් වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 2610 ක් ලෙස ප්‍රකාශ කෙරිනි. මෙම පාසල අයත් වන්නේ.
1. තෙත් කලාපයටය 2. වියළි කලාපයට ය. 3. අතරමැදි කලාපයට ය. 4. ශුෂ්ක කලාපයට ය.

21. මැටි පසක් හා සංසන්දනය කරන විට වැලි පසක
1. අවකාශය අඩු ය. 2. වයනය රළු ය. 3. ජලය රඳවා ගැනීමේ හැකියාව වැඩි ය.
4. පාංශු වාතය අඩු ය.

22. අවශ්‍ය අවස්ථාවලදී, අවශ්‍ය ප්‍රමාණවලින්, අවශ්‍ය ආහාර වර්ග ගුණාත්මක බවින් යුතුව ලබා ගැනීමට ඇති හැකියාව හඳුන්වනු ලබන්නේ,
1. ආහාර පරිරක්ෂණය වශයෙනි. 2. ආහාර සුරක්ෂිතතාවය වශයෙනි.
3. ආහාර සමතුලිතතාව වශයෙනි. 4. ආහාර සංරක්ෂණය වශයෙනි.

23. ජල වහනය අඩු භූමියක වගා කිරීමට ඔබ තෝරා ගනු ලබන බෝග වන්නේ,
1. වම්බටු හා රාබු ය. 2. මාළුමිරිස් හා තක්කාලි ය.
3. කොහිල හා කන්කුන් ය. 4. කව්පි හා මුං ය.

24. මුං, කව්පි, සෝයා බෝංචි යන බෝග කාණ්ඩය කුමන කුලයට අයත් වන්නේ ද?
1. කුකර්බිටේසියේ කුලයයි. 2. පොඒසියේ කුලයි. 3. ෆැබේසියේ කුලයයි. 4. මැල්වේසියේ කුලයයි.

25. ඌණ භාවිත පළතුරු බෝග යනු,
1. ආහාර රුචිය අඩු කරන පළතුරු බෝග ය.
2. ඍජුව පළතුරක් ලෙස භාවිත කළ නොහැකි පළතුරු බෝග ය.
3. මිනිස් ආහාරයට නො ගන්නා සතුන් ආහාරයට ගන්නා පළතුරු බෝග ය.
4. පෝෂණ ගුණයෙන් ඉහළ වුවත් මිනිසා අඩුවෙන් භාවිතයට ගන්නා පළතුරු බෝග ය.

26. වියලි කලාපයේ බහුලව වගා කරන බෝග කාණ්ඩය වන්නේ,
1. ගෝවා හා ලීක්ස් ය. 2. බඩ ඉරිඟු හා කුරක්කන් ය.
3. මාළු මිරිස් හා ලීක්ස් ය. 4. අර්තාපල් හා බී ළුණු ය.

27. ශාක කුල සම්බන්ධයෙන් නොගැලපෙන ප්‍රකාශය කුමක් ද?
1. වම්බටු සොලනේසි කුලයට අයත් වේ.
2. වැටකොළු, කරවිල එකම කුලයට අයත් වේ.
3. මාළු මිරිස් වගා කළ ක්ෂේත්‍රයක ඊ ළඟ කන්නයේ තක්කාලි වගා කිරීමට සුදුසු වේ.
4. ෆැබේසියේ කුලයේ ශාකවල මුල ගැටිති දැකිය හැකි ය.

28. යුරෝපීය ආක්‍රමණ නිසා මෙරට යැපුම් කෘෂිකර්මය වාණිජ කෘෂිකර්මය බවට පත්විය. මෙසේ වානිජකරණය නිසා ප්‍රධාන වගා බවට පත් වූයේ,
1. පොල්, තේ, රබර් හා කෝපි ය. 2. පොල්, පුවක් කිතුල් හා කුරුඳු ය.
3. වී, කුරුඳු, මිරිස් හා පොල්ය. 4. තේ, පොල්, පුවක් හා වී ය.

29. ශ්‍රී ලංකාවේ වියලි කලාපයේ බහුලව දැකිය හැකි පංශු කාණ්ඩය වන්නේ,
1. රතු කහ පොඩ්සොලික් ය. 2. රතු දුඹුරු පස් ය. 3. රතු කහ ලැටසෝල් ය. 4. දියලු පස ය.

30. මූලික බිම් සකස් කිරීමේ ක්‍රියාවලියේ දී සිදු නොවන්නේ,
1. පස පෙරලීම හා කැට පොඩි කිරීමයි. 2. පැල අවට පස බුරුල් කිරීමයි.
3. වල් පැලෑටි මර්ධනයයි. 4. කාබනික ද්‍රව්‍ය පසට යටවීමයි.

31. පහත උපකරණය හා ඉන් කෙරෙන කාර්යය නිවැරදිව සඳහන් නොවන පිළිතුර තෝරන්න.
1. තැටි පෝරුව - ගොඩ ඉඩම් වල කැට පොඩි කිරීම
2. ජපන් රොටරි වීඩරය - වල් මර්ධනය කිරීම
3. ජපන් පරිවර්තන නගුල - වැටි සකස් කිරීම
4. ජෝන් පුල්ලේ බීජවප්කරය - බීජ පේළියට වැපිරීම

32. සිසුවෙක් පස් සාම්පලයක් ගෙන හිස් ජෑම් බෝතලයකට දමා ජලය සමඟ හොඳින් කලතා පැය කිහිපයක් නිසලව තබන ලදී. බෝතලයේ පතුලේ සිට දැකිය හැකි ස්තර පිළිවෙලින්
1. බොරළු, රළුවැලි, සියුම් වැලි, රොන්මඩ හා මැටි ය.
2. රළුවැලි, බොරළු, සියුම්වැලි, මැටි හා රොන්මඩ ය.
3. මැටි, රොන්මඩ, බොරළු, රළුවැලි හා සියුම් වැලි ය.
4. රොන්මඩ, මැටි, රළුවැලි, සියුම්වැලි හා බොරළු ය.

33. ගොවි මහතෙක් තම ගෙවත්තේ රාබු, ගොටුකොළ, ගස්ලබු වගා කිරීමට අදහස් කළේ ය. මෙම බෝග සංස්ථාපනය කිරීමට නිර්දේශිත පාත්ති වර්ග පිළිවෙලින්,
1. වැටි හා කාණු, ගිල් වූ පාත්ති හා තනිවගා වලවල් ය.
2. උස් පාත්ති, ගිල් වූ පාත්ති හා තනිවගා වලවල් ය.
3. උස්පාත්ති, ගිල් වූ පාත්ති, වැටි හා කානු ය.
4. තනිවගා වළවල්, උස්පාත්ති හා ගිල් වූ පාත්ති ය.

34. සත්ත්ව බලයෙන් ක්‍රියාකරන උපකරණය වන්නේ,
1. කොකු නගුල ය. 2. තැටි නගුල ය. 3. ජපන් පරිවර්තන නගුල ය. 4. ගැමි ලී නගු ය.

35. පහත උපකරණ අතුරෙන් අතුරුයත් ගෑමේ උපකරණය වන්නේ,
1. තැටි නගුලයි. 2. ජපන් රොටරි වීඩරයයි. 3. ගැමි ලී නගුලයි. 4. කොකු නගුලයි.

36. බීජ පැල තවානක් නඩත්තු කිරීමේ දී සැළකිය යුතු මූලික කරුණක් නොවන්නේ,
1. ජල සම්පාදනය කිරීමයි. 2. වල් මර්දනයයි.
3. වර්ධක හෝර්මෝන යෙදීමයි. 4. රෝග පලිබෝධ පාලනයයි.

37. ශ්‍රී ලංකාවේ තවාන් පැළවලට බහුලව වැළදෙන දිලීර රෝගයක් වන්නේ,
1. දියමලන් කැමයි 2. ඇන්ත්‍රැක්නෝස් රෝගයයි.
3. විචිත්‍ර වෛරස් රෝගයයි. 4. හිටු මැරීමේ රෝගයයි.

38. එළවළු බීජ තවාන් කිරීම සඳහා සකසනු ලබන නෙරිඩෝකෝ (කුට්ටි තවාන්) කුට්ටියක සම්මත දිග, පළල හා උස වන්නේ,
1. 2cm x 2cm x 2cm ය 2. 3cm x 3cm x 3cm ය. 3. 3cm x 2cm x 1cm ය. 4. 5cm x 5cm x 5cm ය

39. පසට යොදන කාබනික ද්‍රව්‍ය දිරාපත් වී අවසානයේ දී හියුමස් බවට පත් වේ. පසක හියුමස් වැඩියෙන් අඩංගු වීම නිසා එම පසේ
A කැටයන හුවමාරු ධාරිතාව අඩු වේ.
B පසට තද වර්ණයක් ලැබේ.
C ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය වැඩි වේ.
D ජලය රඳවා ගැනීමේ හැකියාව අඩුවේ.
මින් නිවැරදි ප්‍රකාශය වනුයේ
1 A හා B ය 2. A හා D ය 3. B හා C ය 4. C හා D

40. ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රමයට නිදසුනක් වන්නේ,
1. බේසම් ජල සම්පාදනයයි. 2. බිංදු ජල සම්පාදනයයි.
3. පිටාර ජල සම්පාදනයයි. 4. තීරු ජල සම්පාදනයයි.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 10 ශ්‍රේණිය

## කෘෂි හා ආහාර තාක්ෂණය - II

**නම/විභාග අංකය :-- ......................................................................... කාලය : පැය 02 යි.**

♦ පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. පාසලක, තිරසර පාසල් වැඩසටහන යටතේ ගෙවත්තක් සකස් කිරීමට කෘෂිවිද්‍යා ගුරුභවතා ඇතුළු කමිටුව ක්‍රමවත් සැලැස්මක් සාදා වගකීම් පැවරීමක් කර ගෙවත්ත සෑදීම ආරම්භ කරන ලදී.

    11 ශ්‍රේණියේ ප්‍රාථමික බිම් සැකසීම
    10 ශ්‍රේණියේ ද්විතීයික බිම් සැකසීම
    9 ශ්‍රේණියේ තවාන් ශිල්ප ක්‍රම ආදර්ශනය
    7 ශ්‍රේණියේ සිසුන් අතුරුයත්ගෑම වගාව රැක බලා ගැනීම

    i. ප්‍රාථමික බිම් සැකසීමෙන් ඉටුවන ප්‍රධාන අරමුණු දෙකක් සඳහන් කරන්න.
    ii. ද්විතීයික බිම් සැකසීමට අයත් කාර්යයන් දෙකක් ලියන්න.
    iii. 9 ශ්‍රේණියේ සිසුන්ට ආදර්ශනය කළ හැකි තවාන් වර්ග දෙකක් නම් කරන්න.
    iv. සිසුන් තවාන් දැමීමට විවිධ බීජ වර්ග රැස් කරන ලදී. එම බීජ වර්ග අතුරින් තවාන් දැමීමට භාවිත කළ හැකි හා නොහැකි බීජ වර්ග දෙක බැගින් ලියන්න.
    v. ගෙවත්තේ පිවිසුම් දොරටුවට ආරුක්කුවක් නිර්මාණය කර ඇත. මෙයට යැවිය හැකි කුකර්බිටේසියේ කුලයේ එළවළු බෝග 2 ක් ලියන්න.
    vi. ගෙවත්තේ තැනින් තැන දාස්පෙතියා ශාක වැවීමට ගුරුවරයා උපදෙස් දෙන ලදී. මෙහි අරමුණ විය හැක්කේ කුමක් ද ?
    vii. තවාන් ජීවානුහරණය කළ හැකි ක්‍රම දෙකක් ලියන්න.
    viii. අතුරුයත් ගැමේ ක්‍රියාවලියේ නිරත වූ ශිෂ්‍ය කණ්ඩායම ඉටුකළ යුතු කාර්යයන් දෙකක් ලියන්න.
    ix. මෙම ගෙවත්තේ අතුරුයත් ගෑම සඳහා යොදා ගත හැකි කෘෂි උපකරණ දෙකක් නම් කරන්න.
    x. අඛණ්ඩව මෙම ගෙවත්ත වගා කිරීමේ දී පස පුනරුත්ථාපනය කළ යුතු බව ගුරුභවතා පවසන ලදී. එහි දී අවධානය යොමු කළ යුතු කරුණු දෙකක් සඳහන් කරන්න.

02. සාර්ථක බෝග වගාවක් සඳහා පසෙහි සංඝටක මෙන්ම පාංශු ලක්ෂණ කෙරෙහි ද අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ.

    i. a පසෙහි ඛනිජ නොවන සංඝටක දෙකක් නම් කරන්න.
       b පසෙහි කැටායන හුවමාරු ධාරිතාවය වැඩිකර ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ගයක් නම් කරන්න.
    ii. a පසක් ක්ෂාරීය වීමට බලපාන සාධක දෙකක් ලියන්න.
       b ක්ෂාරීයතාවය නිවැරදි කිරීමට පසට යෙදිය යුතු රසායනික ද්‍රව්‍යයක් නම් කරන්න.
    iii. a පාංශු ඛාදනයට බලපාන පාංශු ඛාදන කාරක දෙකක් ලියන්න.
       b පාංශු ඛාදනයේ අහිතකර බලපෑම් දෙකක් ලියන්න.

03. ගෙවත්තක් සැලසුම් සහගතව වගා කිරීමෙන් වාසි රැසක් හිමි වේ.

    i. a ගෙවත්තක වගා කළ හැකි ෆැබේසියේ කුලයට අයත් එළවළු බෝග 2 ක් ලියන්න.
       b මෙම කුලයේ ශාකවල දැකිය හැකි විශේෂත්වය කුමක් ද?
    ii. a බෝග වර්ධනය කෙරෙහි බලපාන කාලගුණික පරාමිතීන් හතරක් නම් කරන්න.
       b එම කාලගුණික පරාමිතීන් මැනීම සඳහා භාවිත කරන උපකරණ නම් කරන්න.
    iii. බෝග වගාවක් නඩත්තු කිරීමේ දී සිදු කළ යුතු පශ්චාත් සාත්තු 3 ක් ලියන්න.

04. සිසුවෙක් වගා බඳුනකට ක්‍රමයෙන් ජලය දමා එහි අතිරික්ත ජලය බඳුනෙන් පහළට ගලා යන බව නිරීක්ෂණය කළේ ය.

    i. පැය භාගයකට පමණ පසු එම බඳුනේ පාංශු තෙතමන මට්ටම සඳහන් කරන්න.
    ii. බඳුන තුළ ඇති ජල ආකාර වලින් ශාකයට ලබා ගත හැකි ජල ආකාරය නම් කරන්න.
    iii. ශාකයට ලබාගත නොහැකි ජල ආකාර නම් කරන්න.
    iv. පාංශු ජීවීන් මගින් ඉටුකරන හිතකර ක්‍රියාවන් දෙකක් සඳහන් කරන්න.
    v. පංශු ඛාදනයේ දී පස් අංශු එකිනෙකින් වෙන්වීම අවම කිරීම සඳහා යොදාගත හැකි ක්‍රම තුනක් සඳහන් කරන්න.

05. සාර්ථක බෝග වගාවක් සඳහා නිරෝගී දිරිමත් පැළ සිටුවීමකළ යුතු ය. මේ සඳහා තවාන් ශිල්ප ක්‍රම භාවිත කරයි.

i. තවානක් සඳහා සුදුසු ස්ථානයක් තේරීමේ දී සලකා බැලිය යුතු කරුණු 3 ක් ලියන්න.

ii. බඳුන් තවාන් ලෙස භාවිතා කළ හැකි ස්ථිර බඳුන් හා තාවකාලික බඳුන් දෙක බැගින් සඳහන් කරන්න.

iii. a තවාන් ජීවානුහරණය කිරීමේ අරමුණ කුමක් ද?

b පිළිස්සීම මගින් තවාන ජීවානුහරණය කරන අයුරු කෙටියෙන් විස්තර කරන්න.

06. බෝග වගාවේ දී කළ යුතු පශ්චාත් සාත්තු අතර ජල සම්පාදනය ප්‍රධාන වේ.

i. බෝග වගාවට ජලයේ ඇති වැදගත්කම් තුනක් ලියන්න.

ii. a පසෙන් ජලය ඉවත්වන ක්‍රම දෙකක් ලියන්න.

b පසට යොදනු ලබන ජලය සංරක්ෂණය කර ගැනීමට කළ හැකි ක්‍රියාකාරකම් 2 ක් ලියන්න.

iii. ජල හිඟයට ඉතා සාර්ථකව මුහුණ දෙමින් ශුෂ්ක පරිසරයේ වගා කළ හැකි බෝග වර්ග 3 ක් ලියන්න.

07. අත්දැකීම් සහිත ගොවිමහතුන් බෝග සංස්ථාපනය කිරීමේ දී නිවැරදි ගැඹුර හා පරතර නිසිලෙස භාවිත කරයි.

i. a බෝග සංස්ථාපනය කිරීමට යොදාගත හැකි රෝපණ ද්‍රව්‍ය ආකාර දෙකක් නම් කරන්න.

b බෝග සංස්ථාපනයේ දී නිවැරදි ගැඹුර හා පරතර භාවිත කිරීමේ ඇති වැදගත්කම් 3 ක් ලියන්න.

ii. බෝග සංස්ථාපන උපකරණ සම්බන්ධ සටහනෙහි හිස්තැන්වලට සුදුසු උපකරණ වල නම් ලියන්න.




iii. පහත සඳහන් උපකරණ ක්‍රියාත්මක කිරීමේ දී යොදාගන්නා බලය අනුව වර්ග කර දක්වන්න.

- අත් පෝරුව
- රේකකය
- තැටි නගුල
- ගැමි ලී නගුල
- ඇණ දත් පෝරුව
- රොට වේටරය

**Answer**

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර පරීක්ෂණය - 2019

## 10 ශ්‍රේණිය

## කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය - පිළිතුරු පත්‍රය

### i පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. 4 | 2. 2 | 3. 3 | 4. 1 | 5. 3 | 6. 4 | 7. 2 | 8. 4 | 9. 4 | 10. 1 |
| 11. 2 | 12. 4 | 13. 1 | 14. 4 | 15. 2 | 16. 4 | 17. 4 | 18. 1 | 19. 4 | 20. 1 |
| 21. 2 | 22. 2 | 23. 3 | 24. 2 | 25. 4 | 26. 2 | 27. 3 | 28. 1 | 29. 2 | 30. 4 |
| 31. 3 | 32. 1 | 33. 2 | 34. 4 | 35. 2 | 36. 3 | 37. 1 | 38. 4 | 39. 3 | 40. 2 |

### II කොටස

01. i ♦ පස පෙරලීම / පස බුරුල් කිරීම ♦ වල් පැළෑටි මර්ධනය (ලකුණු 1 x 2)

ii <u>ද්විතීයික බිම් සැකසීමට අයත් කාර්යයන්</u>

♦ කැට පොඩි කිරීම ♦ ජලවහනු කානු සැකසීම ♦ ගල්මුල් ඉවත් කිරීම

♦ වැටි හා කාණු යෙදීම ♦ පස සමතලා කිරීම ♦ පාත්ති සකස් කිරීම (ලකුණු 1 x 2)

iii ♦ උස් තවාන් ♦ තැටි තවාන් ♦ ගිල්වූ තවාන්

♦ නෙරිඩෝකෝ තවාන් ♦ බඳුන් තවාන් (ල. 1 x 2)

iv තවාන් කරන සහ තවාන් නොකරන බීජ

| තවාන් කරන බීජ | තවාන් නොකරන බීජ |
|---|---|
| වම්බටු | කැරට් |
| තක්කාලි | රාබු |
| මාළු මිරිස් | වට්ටක්කා |
| නෝකෝල් | බණ්ඩක්කා |

(ලකුණු 1 x 2)

v <u>ආරුක්කුවකට යැවිය හැකි කුකර්බිටේසි කුලයේ එළවළු බෝග</u>

♦ වැටකොළු ♦ පතෝල ♦ කරවිල ♦ තුඹ (ලකුණු 1 x 2)

vi <u>දාස්පෙතියා වැවීමේ අරමුණ</u>

පළිබෝධකයින් පලවා හැරීම (ලකුණු 2)

vii <u>තවාන් ජීවානුහරණය කළ හැකි ක්‍රම</u>

♦ පිලිස්සීම ♦ රසායනික ද්‍රව්‍ය

♦ උණු ජලය වත්කිරීම ♦ පොලිතීන් රාමු ක්‍රම

♦ සූර්යාලෝකයට නිරාවරණය කිරීම. ♦ ධූමකරණය (ලකුණු 1 x 2)

viii <u>අතුරුයත් ගැමට අයත් කාර්යයන්</u>

♦ පස් බුරුල් කිරීම ♦ පොහොර, පසට මිශ්‍ර කිරීම

♦ පැළ මුලට පස් දැමීම ♦ වල් මර්ධනය සඳහා උදලු ගෑම (ලකුණු 1 x 2)

ix <u>අතුරුයත් ගැමට භාවිත කළ හැකි උපකරණ</u>

උදැල්ල, අත්මුල්ලුව, අත් ඉස්කෝප්පය, හෝ උපකරණ (ලකුණු 1 x 2)

x පාංශු බාදනය අවම කිරීම

පසෙහි හීන වූ භෞතික, රසායනික ජෛව ලක්ෂණ වගාවට හිතකර පරිදි සංවර්ධනය කිරීම (ලකුණු 1 x 2)

02. i a <u>පසෙහි ඛනිජ නොවන සංඝටක</u>

♦ පාංශු වාතය ♦ පාංශු ජලය ♦ පාංශු ජීවීන් ♦ පාංශු කාබනික ද්‍රව්‍ය (ලකුණු 1 x 2)

b <u>කැටායන හුවමාරුතාවය වැඩි කිරීමට කළ හැකි ක්‍රියාකාරකම්</u>

♦ පසට කාබනික පොහොර එකතු කිරීම.

♦ පසට මැටි එකතු කිරීම (මැටි අඩු පසක නම්) (ලකුණු 1 x 1)

ii a <u>පසක් ක්ෂාරීය වීමට බලපාන සාධක</u>

♦ උෂ්ණත්වය අධික ප්‍රදේශවල වාෂ්පීකරණයේ වැඩිවීම නිසා ජලයේ ඇති ලවණ පස මතු පිටට එක්රැස් වීම

♦ පසක් ජනනය වීමේ දී පසට ලවණ වර්ග එකතු වීම

♦ ලවණ සහිත වාරි ජලය මගින් පසට ලවණ එකතු වීම (ලකුණු 1 x 2)

b ක්ෂාරීයතාවය උදාසීන කිරීම

ජිප්සම් (ලකුණු 1 x 1)

iii a <u>පාංශු ඛාදනයට බලපාන පාංශු ඛාදන කාරක</u>

♦ වර්ෂා ජලය ♦ වේගවත් සුළඟ ♦ මුහුදු රළ හා ගංගාරළ ♦ මිනිස් හා සත්ත්ව ක්‍රියාකාරකම්

(ලකුණු 1 x 2)

b <u>පාංශු ඛාදනයේ අහිතකර බලපෑම්</u>

♦ ශාක ඇද වැටීමට ලක්වීම. ♦ශාක වර්ධනයට සුදුසු පාංශු ස්ථර ඉවත් වීම.

♦ කෘෂිකාර්මික ඉඩම් වල වටිනාකම අඩුවීම

♦ ඉවත්වන පස් ජලාශවල තැන්පත්වීම නිසා ඒවා ගොඩවීමෙන් ගංවතුර ඇති වීම (ලකුණු 1 x 2)

03. i a <u>ගෙවත්තක වගා කළ හැකි ෆැබේසියේ කුලයේ එළවළු බෝග</u>

♦ දඹල ♦ මෑ ♦ පඳුරු මෑ බුෂිටා ♦ ආලංගා ♦ බෝංචි ♦ අවර (ලකුණු 1 x 2)

b <u>මෙම කුලයේ විශේෂත්වය</u>

මෙම ශාකවල මුලෙහි මූල ගැටිති පිහිටීම. එම මූලගැටිති නිසා නයිට්‍රජන් තිර කිරීමේ හැකියාව ඇත

(ලකුණු 1 x 1)

ii a <u>බෝග වර්ධනය කෙරෙහි බලපාන කාලගුනික පරාමිතීන්</u>

♦ වර්ෂාපතනය ♦ ආලෝකය

♦ සුළඟ ♦ සාපේක්ෂ ආර්ද්‍රතාවය

♦ උෂ්ණත්වය (ලකුණු 1/2 x 4 = 2)

b <u>එම කාලගුණික පරාමිතින් මනින උපකරණ</u>

♦ වර්ෂාපතනය - සරල වර්ෂාමානය, ස්වයංක්‍රීය වර්ෂාමානය

♦ උෂ්ණත්වය - උෂ්ණත්ව මානය

♦ සුළගේ වේගය - අනිල මානය

♦ සාපේක්ෂ ආර්ද්‍රතාවය - තෙත් හා වියලි බල්බ උෂ්ණත්ව මානය, ආර්ද්‍රතා මානය

♦ ආලෝක තීව්‍රතාවය - සූර්ය විකිරණමානය

♦ ආලෝකය පවතින කාලසීමාව - සූර්ය දීප්තමානය (ලකුණු 1/2 x 4 = 2)

iii <u>බෝග වගාවක් නඩත්තු කිරීමේ දී කළ යුතු පශ්චාත් සාත්තු ක්‍රියාවන්</u>

♦ ජලය යෙදීම ♦ පොහොර යෙදීම

♦ වල්පැළෑටි මර්ධනය ♦ කෘමි හා රෝග මර්ධනය

♦ පන්දලම් සැකසීම (ලකුණු 1 x 3 = 3)

04. i ක්ෂේත්‍ර ධාරිතා මට්ටම (ලකුණු 2)

ii කේෂාකර්ශන ජලය (ලකුණු 1)

iii a ගුරුත්වාකර්ෂණ ජලය

b ජලාකර්ශන ජලය (ලකුණු 1 x 2)

iv කාබනික ද්‍රව්‍ය වියෝජනය කිරීම

පස මිශ්‍ර කිරීම

ඇලෙන සුලු ද්‍රව්‍ය පිටකිරීම නිසා පාංශු කැටිති ඇති කිරීම (ලකුණු 1 x 2)

v <u>පාංශු ඛාදනයේ දී පස් අංශු එකිනෙකෙහි වෙන් වීම අවම කිරීම සඳහා යොදාගත හැකි ක්‍රම</u>

♦ ආවරණ බෝග වගාව

උදාඃ- පියුරේරියා, - කැලපගෝනියම්

♦ වසුන් යෙදීම

♦ පස ඉක්මනින් ආවරණය වන බෝග වගා කිරීම

♦ වල්පැළ පාලනයේ දී වායව කොටස් පමණක් කපා දැමීම (ලකුණු 1 x 3)

05. i <u>තවානකට සුදුසු ස්ථානයක් තෝරා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු</u>

♦ හිරු එළිය හොඳින් වැටෙන ස්ථානයක් වීම

♦ ජල පහසුකම් සහිත ස්ථානයක් වීම

♦ සාරවත් පසක් වීම

♦ ජලවහනය හොඳින් සිදුවන ස්ථානයක් වීම.

♦ රෝගී වගාවක් නොතිබුන ස්ථානයක් වීම

♦ ප්‍රවාහන පහසුකම් සහිත ස්ථානයක් වීම (ලකුණු 1 x 3)

ii <u>බඳුන් වර්ග</u>

| තාවකාලික බඳුන් | ස්ථිර බඳුන් |
|---|---|
| ♦ පොලිතින් බඳුන්<br>♦ කෙසෙල් පට්ටාවලින් සැකසූ බඳුන්<br>♦ පොල්ලෙලි බඳුන් | ♦ සිමෙන්ති බඳුන්<br>♦ මැටි බඳුන්<br>♦ ප්ලාස්ටික් බඳුන් |

(ලකුණු 1/2 x 4 = 2)

**Answer**

ii a <u>තවාන් ජීවානුහරණය කිරීමේ අරමුණ</u>

තවානේ සිටින රෝග කාරක හා කෘමි පළිබෝධ කොටස් විනාශ කිරීමයි. (ලකුණු 1 x 3)

b <u>පිළිස්සීම මගින් ජීවාණුහරණය කිරීම</u>

- ♦ තවාන හොඳින් තෙත් කිරීම
- ♦ පිදුරු දහයියා තට්ටු වශයෙන් යෙදීම
- ♦ සුළඟ හමන දිහාවට ප්‍රතිවිරුද්ධ දිශාවෙන් ගිනි තැබීම (ලකුණු 1 x 2)

06. i <u>බෝග වගාවට ජලයේ ඇති වැදගත්කම්</u>

- ♦ ප්‍රභාසංස්ලේෂණය ඇතුළු කායික ක්‍රියාවලි සඳහා
- ♦ බීජ ප්‍රරෝහණය සඳහා
- ♦ සමහර බීජවල ව්‍යාප්තිය සඳහා
- ♦ අල බෝගවල අස්වනු නෙළීමේ පහසුව සඳහා
- ♦ වී වගාවේ වල්පැළ පාලනය සඳහා
- ♦ ශාක පෝෂක අවශෝෂණ සඳහා (ලකුණු 1 x 3)

ii a <u>පසෙන් ජලය ඉවත් වන ක්‍රම</u>

- ♦ උත්ස්වේදනය මගින්
- ♦ වාෂ්පීකරණය මගින්
- ♦ ගැඹුරු වැස්සීම මගින් (ලකුණු 1 x 2)

b <u>පසට යොදනු ලබන ජලය සංරක්ෂණය කර ගැනීමට කළ හැකි දේ</u>

- ♦ කාබනික ද්‍රව්‍ය එකතු කිරීම
- ♦ පසට වසුන් යෙදීම
- ♦ වල්පැළෑටි ඉවත් කිරීම (ලකුණු 1 x 2)

iii <u>ජල හිඟයට මුහුණ දෙමින් ශුෂ්ක පරිසර වල වගා කළ හැකි බෝග</u>

- ♦ තල
- ♦ බඩඉරිඟු
- ♦ මෙනේරි
- ♦ බටු
- ♦ කුරක්කන් (ලකුණු 1 x 3)

07. i a <u>බෝග සංස්ථාපනයට යොදා ගත හැකි රෝපණ ද්‍රව්‍ය ආකාර</u>

බීජ, පැළ, වර්ධක කොටස් (පත්‍ර, මුල්, දඬු කැබලි, භූගත කඳන්) (ලකුණු 1 x 2)

b <u>බෝග සංස්ථාපනයේ දී නිවැරදි ගැඹුර සහ පරතර භාවිත කිරීමේ අරමුණු</u>

- ♦ ප්‍රරෝහණය පහසු වීම
- ♦ මුල් වර්ධනයට ප්‍රමාණවත් ඉඩක් ලැබීම
- ♦ පළිබෝධ හානි අවම වීම
- ♦ ශාක අතර තරගකාරීත්වය අඩු වීම
- ♦ කාර්යක්ෂම ලෙස භූමිය භාවිත කළ හැකි වීම.
- ♦ ගසකින් තවත් ගසකට ඇතිවන සෙවනේ බලපෑම අඩුවීම (ලකුණු 1 x 3)

iii <u>භෝග සංස්ථාපන උපකරණ</u>

- බෝග සංස්ථාපන උපකරණ
  - A ____බීජ වප් කර____
    - ගොඩබීජ වප්කරය
    - B ____මඩ වී බීජ වප්කරය____
  - පැල සිටුවීමේ යන්ත්‍ර
    - උදා:- ගොයම් පැල සිටුවීමේ යන්ත්‍ර

(ලකුණු 1 x 2 )

iii <u>කෘෂි උපකරණ වර්ග කිරීම</u>

| මිනිස් ශ්‍රමය | සත්ත්ව බලය | යන්ත්‍ර බලය |
|---|---|---|
| උදැල්ල | ගැමි ලී නගුල | තැටි නගුල |
| ජපන් රොටරි වීවරය | ඇණ දත්පෝරුව | රොට වේටරය |

(ලකුණු 1/2 x 6)